**අධ්‍යයන පොදු සහතික පත්‍ර ( උසස් පෙළ ) උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2013**
**පුනරීක්ෂණ ප්‍රශ්න පත්‍රය.**

**ව්‍යාපාර අධ්‍යයනය - II** (සියලුම හිමිකම් ඇවිරිනි)

***සකස් කිරීම :- අධ්‍යාපන අමාත්‍යංශයේ වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාවේ මෙහෙයවීමෙන්***

## ආදර්ශ ලකුණු දීමේ පටිපාටිය

01. i) ව්‍යාපාරයක් යනු

"මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කරන්නාවූ ඕනෑ ම ආර්ථික කටයුත්තකි." මිනිසාගේ පැවැත්ම සඳහා මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් වීම අවශ්‍ය වේ. එම නිසා මෙම සංකීර්ණ සමාජය තුළ මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම මගින් මිනිසාගේ පැවැත්ම තහවුරු කරලීමට ව්‍යාපාර අත්‍යවශ්‍ය සාධකයක් වී ඇත.

එමෙන්ම නව්‍යතා සම්පාදනයට, නව රැකියා අවස්ථා ජනිත කිරීමට, දළ දේශීය නිෂ්පාදිතය ඉහළ නංවාලීමට, ගෙවුම් ශේෂ හිඟය අවම කිරීමට ව්‍යාපාර දායක වන හෙයින් මිනිසාගේ ජීවන මට්ටම ඉහළ ගොස් ආර්ථික සංවර්ධනයක් ඇති වීමට ව්‍යාපාර අත්‍යවශ්‍ය සාධකයක් වේ.

(ඉහත පරිදි මිනිසාගේ පැවැත්මට මෙන්ම ආර්ථික සංවර්ධනයට ද ව්‍යාපාර අත්‍යවශ්‍ය සාධකයක් බව තහවුරු කෙරෙන සම්පූර්ණ පිළිතුරකට ලකුණු 04 කි. නොඑසේනම් සුදුසු පරිදි ලකුණු පිරිනමන්න.)

ii)
1. වෙළෙඳ පොළෙ හි රැඳී සිටීම.
2. විකුණුම් උපරිම කිරීම.
3. වෙළෙඳ පොළ කොටස වැඩි කර ගැනීම.
4. නව්‍යතා සම්පාදනය.
5. ගුණාත්මක භාණ්ඩ හා සේවා සැපයීම.
6. සේවක සුභසාධනය හා සේවක තෘප්තිය.

(ඉහත ඕනෑම අරමුණු 04ක් පැහැදිලි කිරීමට එකකට ලකුණු 01 බැගින් ලකුණු 04)

iii)

| | | | |
|---|---|---|---|
| 1. | අයිතිකරුවන් | - | ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු කර ගැනීමට |
| 2. | සේවකයින් | - | සේවක ඵලදායකත්වය වැඩිකර ගැනීමට හා සේවක තෘප්තිය ඇති කිරීමට |
| 3. | ණය සැපයුම්කරුවන් | - | අඛණ්ඩ ව අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීමට |
| 4. | රජය | - | විශේෂ සහන ලබා ගැනීමට, යටිතල පහසුකම් ලබා ගැනීමට |
| 5. | ගනුදෙනුකරුවන් | - | අදාල භාණ්ඩය හෝ සේවාව සඳහා වෙළෙඳ පොළ සුරක්ෂිත කර ගැනීමට |

(නම් කිරීමට ලකුණු 1/2 x 4 = ලකුණු 02)
(පැහැදිලි කිරීමට ලකුණු 1/2 x 4 = ලකුණු 02)

iv) (අ)
- i දේශපාලන හා නෛතික පරිසරය
- ii ආර්ථික පරිසරය
- iii සමාජයීය හා සංස්කෘතික පරිසරය
- iv තාක්ෂණික පරිසරය
- v ප්‍රජා පරිසරය
- vi ස්වභාවික පරිසරය
- vii ගෝලීය පරිසරය

(සාධක 6-7 නම් කිරීම ලකුණු 02)
(සාධක 4-5 නම් කිරීම ලකුණු 01)

(ආ) පරිසර සාධක අතර අන්තර් සම්බන්ධතාව නිවැරදි ව දැක්වෙන නිදසුනකට ලකුණු එක බැගින් නිදසුන් දෙකකට ලකුණු දෙකක් ලබා දෙන්න.

v) (අ) 1. අඩුපාඩු සහිත හා අනතුරුදායක නිෂ්පාදිත බිහි කිරීමෙන් වැලකීම.
2. පරිසර දූෂණයෙන් වැලකීම.
3. ශරීරයට අහිතකර ආහාරපාන නිෂ්පාදනය කිරීමෙන් වැලකීම.
4. සම්පත් අපතේ යාම ශූන්‍ය කිරීම හෝ අවම කිරීම.
5. සමස්ත නිෂ්පාදන ක්‍රියාවලිය ඉහළ ප්‍රමිතියකින් යුක්ත ව සැලසුම් කිරීම.

(කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු හතරකට ලකුණු 02)

(ආ) 1. ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීම.
2. ව්‍යාපාරයේ ප්‍රතිරූපය වර්ධනය වීම.
3. පාරිභෝගික විශ්වාසය තහවුරු වීම.
4. වැඩි පාරිභෝගික පිරිසක් ආකර්ෂණය වන බැවින් ලාභදායීත්වය ඉහළ යාම

(කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු හතරකට ලකුණු 02)

02. i) 1. පොලී අනුපාතිකය වෙනස් කිරීම
2. සංචිත අවශ්‍යතා වෙනස් කිරීම
3. විවෘත වෙළෙඳපොළ කටයුතු
4. වට්ටම් අනුපාතිකය වෙනස් කිරීම
5. ණය සීමා පැනවීම

(කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු හතරකට ලකුණු 02)
(එක් පැහැදිලි කිරීමකට ලකුණු 01 බැගින් දෙකකට ලකුණු 02)

ii) (අ) "පාරිභෝගිකයා ගෙවන මුදලට ප්‍රමාණවත් තෘප්තියක් ලබා දීම සහතික කිරීම පිණිස සලසා ඇති නීතිමය ආවරණය පාරිභෝගික ආරක්ෂණය යි." (ලකුණු 01)

(ආ) <u>පාරිභෝගිකයාට</u>

1. ගෙවන මුදලට සරිලන වටිනාකමක් ලැබෙන භාණ්ඩ පරිභෝජනයට අවස්ථාව ලැබීම.
2. වෙළෙඳ විෂමාචාරවලට එරෙහි ව නීතිමය ආවරණය ලබා ගත හැකි වීම.
3. පාරිභෝගික සෞඛ්‍යය හා අරක්ෂාව තහවුරු වීම.

(ලකුණු 1/2 x 3 = ලකුණු 1 1/2)

<u>ව්‍යාපාරිකයන්ට/ නිෂ්පාදකයන්ට</u>

1. ගුණත්වයෙන් යුතු භාණ්ඩ සැපයීම නිසා පාරිභෝගික විශ්වාසය දිනාගත හැකි වීම.
2. පිරිවැටුම වැඩිවීම තුළින් ලාභදායකත්වය ඉහළ යාම.
3. ප්‍රමිතියකට අනුව නිෂ්පාදනය කරන හෙයින් පිරිවැය අඩු වීම.
4. ආයතනයේ කීර්තිනාමය ඉහළ යාම. (ලකුණු 1/2 x 3 = ලකුණු 1 1/2)

iii) 1. ව්‍යාපාරය ආරම්භ කිරීමට අපේක්ෂා කරනු ලබන ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අදාළ ඉල්ලුම් පත්‍ර ලබා ගැනීම.

i) ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය
ii) ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම සඳහා වූ ග්‍රාම නිලධාරී වාර්තාව

2. ග්‍රාම නිලධාරී සහතික කළ වාර්තාව සහ සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍රය ලියාපදිංචියට අදාළ ගාස්තුව ද සමග ප්‍රාදේශීය ලේකම් වෙත භාර දීම.

3. ප්‍රාදේශීය ලේකම් විසින් ඉහත කරුණු සලකා බැලීමෙන් අනතුරු ව ව්‍යාපාර නාමය ලියාපදංචි කිරීමේ සහතිකය නිකුත් කිරීම.

(සම්පූර්ණ පියවර ඇතුළත් පිළිතුරකට ලකුණු 04
පියවර දෙකක් නම් ලකුණු 02
පියවර එකක් නම් ලකුණු 01)

iv)

| සීමාසහිත පොදු සමාගම් | ඇපයෙන් සීමිත සමාගම් |
|---|---|
| 1. අවම සාමාජික සංඛ්‍යාව 01 කි. | 1. අවම සාමාජික සංඛ්‍යාව 02 කි. |
| 2. අරමුණ ලාභය යි. | 2. පොදු පරමාර්ථ අරමුණු කර ගනී. |
| 3. උපයන ලාභ කොටස්කරුවන් අතර බෙදා හරියි. | 3. ලාභ බෙදාහැරීමක් සිදු නොවේ. |
| 4. කොටස් නිකුත් කිරීම මගින් ප්‍රාග්ධනය සම්පාදනය කර ගනී. | 4. කොටස් නිකුත් කිරීමක් සිදු නොවේ. |

(එක් සැසඳීමකට ලකුණු 01 බැගින් සැසඳීම් හතරකට ලකුණු 04)

v)
1. සමූපකාර සුපිරි වෙළෙඳසැල් හඳුන්වාදීම. (කෝප් සිටි, මිනි කෝප් සිටි)
2. අනෙකුත් ආයතන සමග තරගකාරී ලෙස කටයුතු කිරීම.
3. වෙළෙඳසැල් ආකර්ෂණීය ලෙස පවත්වාගෙන යාම.
4. විවිධ අලෙවි ප්‍රවර්ධන ක්‍රම යොදා ගැනීම.
5. විවිධ ක්ෂේත්‍රයන්ට අදාළ සේවාවන්හි නිරත වීම.
   - i) ආරෝග්‍ය ශාලා
   - ii) රක්ෂණ සේවා
   - iii) ප්‍රවාහන සේවා
   - iv) අවමංගල්‍ය සේවා
   - v) සිනමා හල්
   - vi) ආපන ශාලා
6. තොග මිලට භාණ්ඩ සැපයීම.
7. තැන්පතු හා ණය පහසුකම් පුළුල් කිරීම.
8. පාරිභෝගිකයන් සඳහා සපයන පහසුකම් පුළුල් කිරීම.
9. නව තාක්ෂණය භාවිත කිරීම.
10. ණයපත්වලට භාණ්ඩ අලෙවි කිරීම.

(කරුණකට ලකුණු 01 බැගින් කරුණු හතරකට ලකුණු 04)

03. i) (අ)
1. නව්‍යතා සම්පාදනය.
2. දැක්මක් සහිත බව.
3. නම්‍යශීලී වීම.
4. අවදානම් කළමනාකරණය.

(කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු හතරට ලකුණු 02)

(ආ)
1. තීරණ ගැනීම.
2. සම්පත් මෙහෙය වීම.
3. සේවකයන් පෙළඹවීම (අභිප්‍රේරණය).
4. පාලනය. (කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු හතරට ලකුණු 02)

ii) (අ)
1. වේගයෙන් වෙනස් වන ලෝකයේ එම වෙනස්කම්වලට ප්‍රතික්‍රියා දැක්විය හැකි නව්‍යතා සෙවිය හැකි ව්‍යවසායකයින්ගේ දැඩි අවශ්‍යතාවක් පැවතීම.
2. තරගකාරී ව්‍යාපාර ලෝකය තුළ ව්‍යාපාරික අවස්ථා හඳුනා ගැනීමටත් , ඒවා ක්‍රියාත්මක කළ හැකි තත්ත්වයට පත් කර ගැනීමටත් , ඉන් අපේක්ෂිත ප්‍රතිලාභ ජනිත කර ගැනීමටත් ව්‍යවසායකත්වය අවශ්‍ය වීම.
3. වෙනස්වන ලෝකයට නායකත්වය දියහැක්කේ ව්‍යවසායකයන්ට බැවින් සෑම ආයතනයකටම ව්‍යවසායකයන් අවශ්‍ය වීම.

(ඉහත කරුණු දෙකක්වත් අන්තර්ගත වන සේ පැහැදිලි කිරීමට ලකුණු 02)

(ආ) පුද්ගල ප්‍රතිලාභ :-
1. ඉහළ කැපවීම මත ඉහළ ප්‍රතිලාභ ලබාගත හැකි වීම.
2. පුද්ගල හැකියාවලින් ප්‍රයෝජන ගැනීමට ඉඩ ප්‍රස්ථා ලැබීම.
3. සමාජ තත්ත්වය හා පිළිගැනීම ඇති වීම.
4. පෞද්ගලික මූල්‍යමය ලාභ

(කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු දෙකකට ලකුණු 01)

ආර්ථික ප්‍රතිලාභ :-

1. පූර්ණ සේවා නියුක්තිය ඇති වීම.
2. ජනතාවගේ ජීවන මට්ටම ඉහළ යාම.
3. ප්‍රාදේශීය සම්පත් නිෂ්පාදනයට යොදා ගැනීම.
4. නව වෙළෙඳ පොළවල් සංවර්ධනය වීම.
5. දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම.
6. වෙනත් (කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු දෙකකට ලකුණු 01)

iii) (අ) ආදේශ මුදල් මගින් ඉටු වන්නේ මුදලෙහි කාර්යයක් වන "විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම." යන කාර්යය පමණි.

එහෙත් මුදලෙහි සෙසු කාර්යයන් වන වටිනාකමේ මිම්මක් ලෙස කටයුතු කිරීම, විලම්බිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම සහ වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම යන කාර්යයන් ආදේශ මුදල් මගින් ඉටු නොවේ.

(සම්පූර්ණ පිළිතුරට ලකුණු 02)

(ආ) මෙය විවෘත ප්‍රශ්නයකි.
හොඳ මුදලක ලක්ෂණ හතරක් ඇතුලත් ව කරන ලද විමසීමකට සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. නොඑසේ නම් සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.

(සම්පූර්ණ පිළිතුරකට ලකුණු 02)

iv) (අ)
1. තැන්පත්කරුවන්ගේ තැන්පත් මුදල් ආරක්ෂා කිරීම.
2. මූල්‍ය ප්‍රතිපත්තිය මැනවින් පවත්වාගෙන යාම.
3. මූල්‍ය ආයතනවල ද්‍රව්‍යශීලීතාවය සහ නුබුත්වත්බව ආරක්ෂා කිරීම.

(කරුණකට ලකුණු 01 බැගින් කරුණු තුනට ලකුණු 03)

(ආ) පරිගණක තාක්ෂණය භාවිත කරමින් බැංකු අතර සිදුවන ගනුදෙනු පියවීමට භාවිතා කරන ක්‍රමයකි. (ලකුණු 01)

v)
1. භාර දෙන්නාට නීතිමය හිමිකමක් තිබේද?
2. රේඛනය පැවරීමට බාධාවක්ද?
3. පිටසන් කර ඇති ආකාරය නිවැරදිද?
4. චෙක්පතෙහි ලිඛිත අඩුපාඩු තිබේද? යන කරුණු

(කරුණකට ලකුණු 01 බැගින් කරුණු හතරට ලකුණු 04)

04. i) (අ) **ප්‍රතිරක්ෂණය :-**

රක්ෂණ සමාගමක් විසින් භාරගන්නා ලද අවදානම් එම රක්ෂණ සමාගම විසින් ම තවත් රක්ෂණ සමාගමක හෝ කිහිපයක රක්ෂණය කිරීමයි. (ලකුණු 01)

(ආ) **ආදේශනය :-**

රක්ෂිත දේපලකට සිදුවූ හානියක දී රක්ෂණ සමාගම වන්දි ගෙවීමෙන් පසුව, බාහිර පාර්ශවයන්ගෙන් රක්ෂිතයාට ලබාගත හැකි වෙනත් වාසි හා අයිතීන් රක්ෂකයාට පැවරෙන බවයි. (ලකුණු 01)

(ඉ) **ප්‍රාරක්ෂණය :-**

උවදුරු රක්ෂණයක දී විශාල වටිනාකමෙන් යුත් වත්කම්, රක්ෂිතයා විසින් රක්ෂණ සමාගම් කිහිපයක කොටස් වශයෙන් රක්ෂණය කිරීම යි. (ලකුණු 01)

(ඊ) **රක්ෂණ ඔප්පුව :-**

කිසියම් ජීවිතයකට හෝ දේපලකට අදාලව රක්ෂණ ගිවිසුමක් ඇති වූ පසුව ඊට අදාලව රක්ෂණ සමාගම විසින් රක්ෂිතයාට දෙනු ලබන සහතිකයයි.

(ලකුණු 01)

ii) **මාර්ගය :-**

1. අධිවේගී මාර්ග (මහාමාර්ග හා දුම්රිය මාර්ග)
2. ගුවන් පාලම්
3. උමං මාර්ග
4. ද්විත්ව දුම්රිය මාර්ග
5. දුම්රිය මාර්ග ව්‍යාප්තිය
6. මාර්ග නවීකරණය
7. නව සංඥා පද්ධති
8. ඇළ මාර්ග නවීකරණය

**මාධ්‍යය :-**

1. බලවේග දුම්රිය කට්ටල
2. නවීන තාක්ෂණයෙන් යුත් අධි සුඛෝපභෝගී වාහන
3. විවිධ භාණ්ඩවලට ගැලපෙන විවිධ රථ වාහන
4. ගුවන් බස් කෙටි දුර සඳහා භාවිතය
5. දියමත ගොඩබස්වන ගුවන් යානා
6. ඇළ මාර්ග සඳහා නවීන යාත්‍රා යොදා ගැනීම

**බලය :-**

1. සූර්ය කෝෂ බැටරි ආදියෙන් වාහන ධාවනය
2. ගෑස් බලයෙන් වාහන ධාවනය
3. නව ඛනිජ තෙල් හා ගෑස් නිධි පිළිබඳ ගවේෂණය
4. දෙමුහුන් (Hybrid) තාක්ෂණය

**පර්යන්තය :-**

1. නව තාක්ෂණය සහ පහසුකම් සහිත වරාය අලුතෙන් ඉදි කිරිම.
2. විශාල ගුවන්යානා නැවැත්විය හැකි නව තාක්ෂණය සහ පහසුකම් සහිත ගුවන්තොටුපළ
3. නව පහසුකම් හා සේවා සහිතව (භෝජනාගාර, නැවතුම්හළ්, විවේක කාමර) බස් නැවතුම්පළ හා දුම්රිය ස්ථාන නවීකරණය.
   (ප්‍රවාහන පද්ධතියෙහි මූලිකාංග හතරම ආවරණය වන පරිදි ලියා ඇති සම්පූර්ණ පිළිතුරකට ලකුණු 04 කි. නොඑසේනම් සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.)

iii) **ව්‍යාපාර කටයුතුවල දී**

1. වෙළෙඳ ගනුදෙනුවල දී අදාළ පාර්ශව අතර තොරතුරු හුවමාරු කර ගැනීමට
2. සේව්‍ය සේවක සම්බන්ධතා පවත්වාගෙන යාම සඳහා
3. අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා
4. මානව හා භෞතික සම්පත් මනාව කළමනාකරණය කිරීමට
5. සේවක ආකර්ෂණය හා බඳවා ගැනීමට
6. සේවක අභිප්‍රේරණයට
7. තීරණ ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට
8. ආයතනයේ විවිධ දෙපාර්තමේන්තු අතර ඵලදායී සම්බන්ධීකරණයක් ඇති කිරීමට
9. වෙනත් (ඉහත ඕනෑම කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු හතරකට ලකුණු 02)

**සමාජයීය කටයුතුවල දී**

1. පුද්ගලයින් අතර අන්තර් සබඳතා ඇති කිරීමට හා වර්ධනය කිරීමට
2. ජාත්‍යන්තර වශයෙන් සබඳතා වර්ධනය කර ගැනීමට
3. රැකියා ඇබෑර්තු වැනි වැදගත් කරුණු දැන ගැනීමට
4. වැදගත් සිදුවීම් සිදු වූ අවස්ථාවේ දී ම දැන ගැනීමට
5. විවිධ පාර්ශව අතර අදහස් හා තොරතුරු හුවමාරු කර ගැනීමට
6. මුදල් හුවමාරු කර ගැනීමට
7. විවිධ අනතුරු හා ආපදා පිළිබඳ ව කල්තියා දැන ගැනීමට හා දැනුම් දීමට
8. වෙනත්

(කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු හතරකට ලකුණු 02)

iv) (අ) I **පාරිභෝගිකයාට**

- පාරිභෝගිකයාට අවශ්‍ය භාණ්ඩ අවශ්‍ය ප්‍රමාණයෙන් අවශ්‍ය වෙලාවට සැපයීම
- පාරිභෝගිකයාට නව භාණ්ඩ හඳුන්වා දීම

(කරුණු දෙකකට ලකුණු 01)

II **නිෂ්පාදකයාට**

- නිෂ්පාදකයාට අවශ්‍ය තොරතුරු සැපයීම
- ප්‍රදර්ශන පුවරු හා පෝස්ටර් ප්‍රදර්ශනය
- සාම්පල් බෙදා දීම, ප්‍රදර්ශන කටවුට් මගින් භාණ්ඩ ප්‍රවර්ධනය

(කරුණු දෙකකට ලකුණු 01)

(ආ)
1. නවීන කළමනාකරණ ශිල්පක්‍රම යොදා ගැනීම
2. මහා පරිමාණ සිල්ලර වෙළෙඳ සල් පවත්වාගෙන යාම
3. පරිගණකගත කල මිල දර්ශක
4. විද්‍යුත් ගෙවීම් ක්‍රම භාවිතය
5. ගනුදෙනුකරුවන් සමග ජාල සබඳතා පවත්වා ගැනීම
6. වෙනත්

(කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු හතරකට ලකුණු 02)

v)

- අපනයනකරුවකු ලෙස ලියාපදිංචි වීම
- විදේශ ගැනුම්කරුවන් සොයා ගැනීම
- අවශ්‍ය වන්නේ නම් අපනයන බලපත්‍ර ලබා ගැනීම
- ආනයනකරුගෙන් ලැබුණු මිල විමසුමට ප්‍රතිචාරයක් වශයෙන් මිල කියුමක් යැවීම
- ඉන්ඩෙන්ටුව ලැබීම
- භාණ්ඩ තොගය නැව්ගත කිරීම සඳහා අවශ්‍ය ඉඩකඩ වෙන් කර ගැනීම හා අවශ්‍ය ලියවිලි සකස් කර ගැනීම
- නැව්ගත කිරීමට සුදුසු වන ආකාරයට භාණ්ඩ ඇසුරුම් කිරීම
- අපනයන භාණ්ඩ තොගය රක්ෂණය කිරීම
- භාණ්ඩ නැව්ගත කර නෞභාරපත ලබා ගැනීම
- මුදල් ලබා ගැනීමට අදාළ කටයුතු කිරීම

(අදාල පියවර 06ක් වත් නිවැරදි ව දැක්වෙන පිළිතුරකට ලකුණු 04)
(පියවර 4 - 5 නම් ලකුණු 03)
(පියවර 03 නම් ලකුණු 01)

05. i)
1. ආයතනයේ අරමුණු හා පරමාර්ථ සාර්ථක ව ළඟා කර ගැනීමට
2. සීමිත සම්පත් සාර්ථකව හා සඵලදායී ව යොදා ගැනීම
3. ගතික ව්‍යාපාර පරිසරයට සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමට
4. තරගකාරිත්වයට සාර්ථක ව මුහුණදීම තුලින් ව්‍යාපාරයේ දිගුකාලීන පැවැත්ම තහවුරු කර ගැනීමට
5. ආයතනය පුළුල්වත්ම ඒවායේ කටයුතු සංකීර්ණභාවයට පත්වන බැවින් එම තත්ත්වයන්ට සාර්ථකව මුහුණ දීමට
6. ආයතනය පිළිබඳ ඇල්මැති පාර්ශවයන්ගේ අපේක්ෂා උපරිම ලෙස ඉටු කර දීමට
7. ගැටලුවලට සාර්ථකව මුහුණදීමට හා නිවැරදි තීරණ ගැනීමට
8. ව්‍යාපාර සමාජ වගකීම් ඉටු වන අයුරින් කටයුතු කිරීමට

(ඉහත ඕනෑ ම කරුණු හතරක් ඇතුලත් සම්පූර්ණ පිළිතුරකට ලකුණු 04)

ii) අධිකාරිය යනු විවිධ කාර්යයන් කිරීම සඳහා හෝ අණකිරීම සඳහා හෝ සම්පත් බෙදා හැරීම සඳහා ඇති බලය යි. (අධිකාරිය යනු සංවිධානයක කළමනාකරුට ලැබෙන නීත්‍යානුකූල බලය යි.) (ලකුණු 01)

වගකීම යනු යම් තනතුරකට අදාළ ව ඉටු කළ යුතු කාර්යය භාරය යි. (ලකුණු 01)

තම කටයුතුවල ප්‍රතිඵල පිළිබඳ ව සුපරික්ෂකට වාර්තා කිරීමට හා සාධාරණීකරණය කිරීමට ඇති බැඳීම වගවීම යි. (ලකුණු 01)

අධිකාරිය ඉහළ කළමනාකරණයේ සිට පහළ කළමනාකරණයට පැවරේ. වගකීම් ඉටු කිරීමට අධිකාරිය හෙවත් බලතල පැවරිය යුතු යි. එම නිසා අධිකාරිය පැවරීමත් සමඟ වගකීම් ද පැවරේ. අධිකාරියෙන් පැවරුණු කාර්යය පිළිබඳ ව ඉහළ කළමනාකාරිත්වය වාර්තා කිරීම හා යම් අඩුපාඩුවක් වේ නම් එය සාධාරණීය කිරීම පහළ කළමනාකාරිත්වය විසින් කළ යුතු ය. එය වගවීම යි.




(ලකුණු 01)

iii) ආයතනයක තනතුරු, කාර්යය, බලතල, වගකීම් යනාදිය බෙදී ඇති හා සමායෝජනය වී ඇති ආකාරය දැක්වෙන සටහන සංවිධාන සටහනයි. (ලකුණු 01)
ඉදිරිපත් කළ හැකි ආකාර

1) චක්‍රීය සංවිධාන සටහන



2) සිරස් සංවිධාන සටහන



3) තිරස් සංවිධාන සටහන



(ලකුණු 1 x 3 ලකුණු = 03)

iv) (අ) පවත්නා නිෂ්පාදිතය පිළිබඳවත් නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳවත් නව නිෂ්පාදන සැලසුම් පිළිබඳවත් තොරතුරු ඒකරාශී කිරීම හා ඒවා වැඩි දියුණු කිරීම පර්යේෂණ හා සංවර්ධනය ලෙස හැඳින්වේ. (ලකුණු 01)

(ආ)
1. නිෂ්පාදිතයේ ගුණත්වය ඉහළ යාම
2. නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩි වීම
3. නිෂ්පාදන පිරිවැය අඩු වීම
4. නව භාණ්ඩ හා සේවා හඳුන්වා දීම
5. අපතේ යාම් අවම කර ගැනීමට හැකි වීම
6. නිෂ්පාදිතයේ ගුණත්වය ඉහළ යාම නිසා පාරිභෝගික තෘප්තිය ඉහළ යාම
7. පාරිභෝගික ඉල්ලුම වැඩි වීම මගින් ලාභදායීත්වය ඉහළ යාම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු හයකට ලකුණු 03)

v) (අ) තොග ඇණවුම් කිරීමේ පිරිවැය හා තොග පවත්වාගෙන යාමේ පිරිවැය යන දෙකෙහි එකතුව මුළු තොග පිරිවැය යි.

(ආ) නිෂ්පාදනයට අදාළ සියලු මූලිකාංග පරිගණක ජාලයකින් ඒකාබද්ධ කර සිදු කිරීම.

(ඉ) වටිනාකමෙන් වැඩි එහෙත් අඩු ඉඩකඩක් අවශ්‍ය තොග A වශයෙන් ද, මධ්‍යස්ථ වටිනාකමක් සහිත මධ්‍යස්ථ ඉඩකඩක් අවශ්‍ය තොග B වශයෙන් ද, අඩු වටිනාකමක් සහිත වැඩි ඉඩකඩක් අවශ්‍ය තොග C වශයෙන් ද, වෙන් කර ගෙන තොග පාලනය කිරීම ABC විශ්ලේෂණය ලෙස හැඳින්වේ.

(ඊ) එක ම වර්ගයේ භාණ්ඩයක් අඛණ්ඩ ව, රේඛීය ව ගලායන ආකාරයට විශාල ඒකක ප්‍රමාණයකින් නිෂ්පාදනය කිරීම ප්‍රවාහ නිෂ්පාදනය වේ.

(එක් පැහැදිලි කිරීමකට ලකුණු 01 බැගින් ලකුණු 04)

06. i) නිෂ්පාදන ආයතනයක් විසින් ස්ථාපිත කෙරෙන ප්‍රමිතිවලට අනුකූලව නිෂ්පාදනය සිදුවන්නේ ද යන්නත්, අවම නෛතික අවශ්‍යතාවලට අනුව නිෂ්පාදනය කරනු ලබන්නේ ද යන්නත් තහවුරු කර ගැනීමේ ක්‍රියාවලිය තත්ත්ව පාලනය යි. (ලකුණු 01)

තත්ත්ව පාලන ශිල්ප ක්‍රම නම්,

1. තත්ත්ව ආරක්ෂණය
2. ශුන්‍ය දෝෂ
3. තත්ත්ව කව
4. ගුණත්ව ප්‍රමිති
5. සමස්ත තත්ත්ව කළමනාකරණය
6. සංඛ්‍යානමය ක්‍රියාවලි පාලනය

(ලකුණු 1/2 x 6 = ලකුණු 03)

ii) (අ) සම්බන්ධතා අලෙවිකරණය, සමෝධානික අලෙවිකරණය, අභ්‍යන්තර අලෙවිකරණය හා සමාජයීය වගකීම් අලෙවිකරණය යන සියලු කොටස්වල පරිපූර්ණ ඒකාබද්ධ ප්‍රවේශයක් ලෙස සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පය හැඳින්විය හැකි ය.

(සම්පූර්ණ පිළිතුරට ලකුණු 02)

(ආ) විෂම ගතිලක්ෂණවලින් යුක්ත සමස්ත වෙළෙඳ පොළ සමජාතීය ගති ලක්ෂණවලින් යුක්ත වූ කණ්ඩායම්වලට බෙදා වෙන් කිරීම වෙළෙඳපොළ ඛණ්ඩනය නමින් හැඳින්වෙන අතර එසේ වෙන් කළ කණ්ඩායම් අතරින් ආයතනයට වඩාත් ආකර්ෂණීය ලෙස මෙන්ම ලාභදායී ව සේවය කළ හැකි වෙළෙඳ පොළ කොටස ඉලක්ක වෙළෙඳ පොළ යි. (සම්පූර්ණ පිළිතුරට ලකුණු 02)

iii) (අ) එක් නිෂ්පාදකයෙකුගේ නිෂ්පාදිත, තරඟකාරී අන් නිෂ්පාදනවලින් වෙන් කොට හඳුනා ගැනීම සඳහා භාවිත කළ හැකි නමක්, වචනයක්, සංකේතයක්, සලකුණක්, මෝස්තරයක් හෝ ඒවායේ සංයෝගයක් සන්නමක් ලෙස හැඳින්වේ.

(ලකුණු 01)

(ආ) <u>ව්‍යාපාරිකයාට</u>

1. අනෙකුත් තරඟකාරී සන්නම්වලින් තම ආයතනයේ සන්නම වෙන් කොට හඳුනා ගත හැකි වීම.
2. ඇණවුම් ලබා ගැනීමේ පහසුව
3. නීතිමය ආරක්ෂාව සැලසීම
4. පාරිභෝගිකයින් අතර සන්නම් පක්ෂපාතීත්වයක් ඇති වීම
5. ආයතනයේ සමස්ත ප්‍රතිරූපය වර්ධනය වේ
6. ව්‍යාපාරයට වටිනාකමක් නිර්මාණය වීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 03ට ලකුණු 1 1/2)

<u>ගනුදෙනුකරුට</u>

1. භාණ්ඩ තෝරා ගැනීම පහසු වීම
2. ව්‍යාජ භාණ්ඩවලින් ආරක්ෂා වීම
3. අවශ්‍ය භාණ්ඩය නම් කර ලබා ගත හැකි වීම
4. ජනප්‍රිය හා හොඳ තත්ත්වයේ භාණ්ඩ මිලදී ගැනීම පහසු වීම
5. පැමිණිලි ඉදිරිපත් කිරීම පහසු වීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 03ට ලකුණු 1 1/2)

iv) මෙය භාණ්ඩයක් නිසා භාණ්ඩ අලෙවි මිශ්‍රයේ විචල්‍යයන් වන

1. නිෂ්පාදිතය 3. ස්ථානය
2. මිල 4. ප්‍රවර්ධනය

යන විචල්‍යයන් යොදා ගන්නා ආකාරය පිළිබඳ ව පැහැදිලි කළ යුතු ය.

(නම් කිරීමට ලකුණු 1/2 x 4 = ලකුණු 02)
(පැහැදිලි කිරීමට ලකුණු 1/2 x 4 = ලකුණු 02)

v) (අ) රටක ආර්ථිකයක මූල්‍ය තීරණ ක්‍රියාත්මක කරන මූල්‍ය වෙළෙඳපොළ, මූල්‍ය ආයතන, මූල්‍ය උපකරණ සහ මූල්‍ය යටිතල පහසුකම් යනාදියෙන් සමන්විත පද්ධතිය යි.

(ලකුණු 01)

(ආ)
1. තත්කාලීන දළ පියවීම් පද්ධතිය (RTGS)
2. ඡායාගත පිළිබිඹු චෙක්පත් නිෂ්කාශන පද්ධතිය (CTS)
3. නිර්ලේඛන සුරැකුම්පත් පියවුම් පද්ධතිය (SSSS)

(ලකුණු 1x3 = ලකුණු 03)

07. i) (අ) <u>මූල්‍ය උපකරණ</u>

1. සාමාන්‍ය කොටස්
2. වරණීය කොටස්
3. සාංගමික ණයකර
4. රජයේ සුරැකුම්පත් (භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර)

(මූල්‍ය උපකරණ 04 ක් නම් කිරීමට ලකුණු 02)

(ආ) **ආයෝජකයෙකුට ලැබෙන ප්‍රතිලාභ**

- ලාභාංශ
- සංචිත ප්‍රාග්ධනිකරණය
- හිමිකම් නිකුතුව
- ප්‍රාග්ධන ලාභ
- විභජනය (ප්‍රතිලාභ හතරකට ලකුණු 02)

ii) (අ) අපේක්ෂිත අනාගත කාලච්ඡේදයකට අදාලව පුරෝකථනය කල මුදල් ලැබීම් හා ගෙවීම් ඇතුලත් කර සකස් කරන ලේඛනය මුදල් අයවැය ලේඛනය වේ. (ලකුණු 01)

(ආ) I අනාගතයේ දී මුදල් අතිරික්තයක් වේ නම්, එය කල්තබා දැන ගත හැකි වීමෙන් එම මුදල් ඵලදායී ව ආයෝජනය කළ හැකි වීම

II අනාගතයේ දී මුදල් ඌනතාවක් වේනම්, එය ද කල්තබා දැනගෙන ඊට මුහුණ දීමට සූදානම් විය හැකි වීම

III සත්‍ය මුදල් ක්‍රියාකාරීත්වය හා සැසඳීම මගින් මුදල් පිළිබඳ සැලසුම්කරණය හා පාලනය පහසුවීම (ප්‍රයෝජන තුනකට ලකුණු 03)

iii) (අ) 1. තනතුරු නාමය
2. වයස් සීමාව
3. සේවා කොන්දේසි
4. අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම්
5. පලපුරුද්ද
6. වැටුප් පරිමාණය (ලකුණු 1/2x4 = ලකුණු 02)

(ආ) 1. පුවත්පත
2. අන්තර්ජාලය
3. රූපවාහිනිය
4. ගුවන්විදුලිය
5. රජයේ ගැසට්පත
6. දැන්වීම්
7. පෝස්ටර් (ලකුණු 1/2x4 = ලකුණු 02)

iv) (අ) කළමනාකරණ නොවන සේවකයින්ට මෙහෙයුම් කටයුතුවලට අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්ප ලබාදීම සඳහා ක්‍රියාත්මක කරන කෙටිකාලීන වැඩසටහන් (ලකුණු 01)

(ආ) 1. ආධුනිකත්ව පුහුණුව
2. රැකියාව තුලින් පුහුණුව
3. රැකියාවන් අතර මාරුව
4. දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන්
5. භූමිකා රංගනය
6. සමාකරණය/ අනුකරණය
(කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු හයට ලකුණු 03)

v) වෘත්තිය අයිතිවාසිකම් ලබා ගැනීම සඳහාත් ඒවා රැක ගැනීම සඳහාත් කිසියම් කර්මාන්ත ක්ෂේත්‍රයක නියැලී සේව්‍යයන් හෝ සේවකයන් පිරිසක් ස්වේච්ඡාවෙන් පිහිටුවාගත් සංවිධානයකි. (ලකුණු 01)

**අරමුණු**

1. සාධාරණ වැටුපක් සහ යහපත් වැඩ පරිසරයක් ලබා ගැනීම
2. වැඩ කරන කාලය අඩු කර ගැනීම
3. වෘත්තියමය සෞඛ්‍යය හා වෘත්තීමය අනතුරුවලින් ආරක්ෂාව සළසා ගැනීම
4. ආයතනයේ කළමනාකරණ තීරණවලට සහභාගී වීම
5. රැකියා සුරක්ෂිතතාවය ඇති කර ගැනීම
6. අධ්‍යාපනය හා පුහුණුව ලබා ගැනීම
7. අසනීප, විශ්‍රාමික හෝ වැඩවර්ජන සේවකයින්ට සහන ලබා දීම

(කරුණකට ලකුණු 01 බැගින් කරුණු තුනකට ලකුණු 03)

08. i) (අ) විදුලි සංදේශ හා පරිගණක තාක්ෂණය ඔස්සේ වාචික, රූපමය, අක්ෂරමය හා අංකමය තොරතුරු අත්පත් කර ගැනීම, සැකසීම, ගබඩාකිරීම හා බෙදා හැරීම තොරතුරු තාක්ෂණය වේ. (ලකුණු 01)

(ආ) 1. පරිගණක තාක්ෂණය
2. සන්නිවේදන තාක්ෂණය
3. තොරතුරු කළමනාකරණ තාක්ෂණය (ලකුණු 1x3 = ලකුණු 03)

ii) 1. අගුල්පද (Pass Word) භාවිතය
2. වෛරස නාශක මෘදුකාංග (Virus Guard) භාවිතය
3. භාවිතා කරන්නාගේ අනන්‍යතාව තහවුරු කර ගැනීම
4. තොරතුරු පිටපත් පිටත ස්ථානයක ගබඩා කිරීම

(කරුණකට ලකුණු 01 බැගින් කරුණු හතරට ලකුණු 04)

iii) (අ) <u>බස් ජාල හා මුදු ජාල</u>

සියලු පරිගණක පොදු පථයකට ඍජුව සම්බන්ධවන සේ ස්ථානගත කර ඇති ජාල බස් ජාල වන අතර සෑම පරිගණකයක්ම තවත් පරිගණක දෙකකට සම්බන්ධ කර ඇති ජාල මුදු ජාල වේ.

(ආ) <u>ප්‍රාදේශීය ක්ෂේත්‍ර ජාල හා පුළුල් ක්ෂේත්‍ර ජාල</u>

එක ම ගොඩනැගිල්ලක හෝ එක ම වැඩ බිමක පිහිටා තිබෙන පරිගණක එකිනෙකට සම්බන්ධ කොට සකසා ඇති ජාල ප්‍රාදේශීය ක්ෂේත්‍ර ජාල වන අතර නගර කිහිපයක හෝ රටවල් කිහිපයක තිබෙන පරිගණක සම්බන්ධ කර ගොඩනගා ගත් පරිගණක ජාල පුළුල් ක්ෂේත්‍ර ජාල වේ.

(ඉ) <u>ගනුදෙනු සැලසුම් පද්ධති (TPS) හා කාර්යාල ස්වයංකරණ පද්ධති (OAS)</u>

සංවිධානයක දෛනික මෙහෙයුම් කටයුතුවලින් බිහිවන දත්ත සැකසීමට භාවිත කරන තොරතුරු පද්ධති ගනුදෙනු සැකසුම් පද්ධති වන අතර දත්ත හා තොරතුරු විද්‍යුත් ආකාරයට පිටපත් කර ගැනීමත් ඒවා ඒ ආකාරයෙන්ම සන්නිවේදනය කිරීම සඳහාත් පහසුකම් සළසනු ලබන තොරතුරු පද්ධතිය කාර්යාල ස්වයංකරණ පද්ධතියයි.

(ඊ) <u>පාඨ කථන (Text chatting) හා හඬ කථන (Voice chatting)</u>

තම අදහස් ටයිප් කර පරිගණක හෝ දුරකථන (ජංගම හා රැහැන් රහිත CDMA) මගින් අනෙක් පාර්ශවය වෙත යොමු කිරීම පාඨ කථන වන අතර මයික්‍රෆෝන භාවිතා කරමින් අන්තර්ජාලය ඔස්සේ වාචිකව අදහස් හුවමාරු කිරීම හඬ කථන ද වේ. (ලකුණු 1x4 = ලකුණු 04)

iv)

| | | | |
|---|---|---|---|
| 1. | විභව ආයෝජකයන් | - | ආයෝජකයින් ආයෝජනයට පෙළඹවීම, විශ්වාසය ගොඩ නැගීම |
| 2. | බැංකු හා මූල්‍ය ආයතන | - | අරමුදල් ලබා ගැනීම සඳහා ශක්‍යතාව පෙන්නුම් කිරීම |
| 3. | සේවකයින් | - | ප්‍රධාන තනතුරු සඳහා දක්ෂ හා පළපුරුදු සේවකයන් ආකර්ෂණයට |
| 4. | කළමනාකරුවන් | - | මෙහි ඉලක්ක හා පරමාර්ථ පැහැදිලිව දැක්වෙන බැවින් සම්පත් මනා ලෙස හසුරාවාලීමට |
| 5. | උපක්‍රමික කණ්ඩායම් | - | අලෙවි, මූල්‍ය, මානව, පර්යේෂණ සංවර්ධන යන අවශ්‍යතා පිළිබඳ කණ්ඩායම්වල සහාය ලබා ගැනීමට |

(පාර්ශව හතරක් නම් කිරීමට ලකුණු 02)

(හේතු දැක්වීමට ලකුණු 02)

(මුළු ලකුණු 04)

v) (අ) - ආරම්භ කිරීමට අපේක්ෂිත ව්‍යාපාරය ශක්‍යතාවයෙන් යුක්ත ද?

- ආයෝජනයට ලැබෙන ඉපැයුම ප්‍රමාණවත් ද නැතිනම් ගත යුතු ක්‍රියා මාර්ග මොනවාද යන්න පිළිබඳ ව (එක් කරුණකට ලකුණු 01)

(ආ) I ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශය

II ඇස්තමේන්තුගත ශේෂ පත්‍රය

III ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(කරුණකට ලකුණු එක බැගින් කරුණු තුනට ලකුණු 03)

***